# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2024 ජනවාරි**


**06 වෙළුම 01 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2024 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 971ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.8කින් සුළු වශයෙන් පහළ ගියේය.

2024 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,512ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.2කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2024 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.8කින් පහළ ගියේය. ඊට විරුද්ධව, එම මාසය තුළ ආනයන වියදම් සියයට 6.2ක ඉහළ යෑමක් වාර්තා කළේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2023 වසරේ ජනවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 445ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 541ක් දක්වා පුළුල් විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2024 ජනවාරි)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි




### අපනයන පරිමා හා මිල දර්ශක - ජනවාරි





2024 වසරේ ජනවාරි මාසය තුළ දී කාර්මික සහ ඛනිජමය නිෂ්පාදිත අපනයන කාණ්ඩයන්හි ආදායම පහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායමෙහි සුළු පහළ යෑමක් වාර්තා විය.


2024 වසරේ ජනවාරි මාසය තුළ දී, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 4.4කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 4.9කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය ජනවාරි





### තේ සහ රබර් මිල ගණන්





2024 වසරේ ජනවාරි මාසය තුළ දී, ප්‍රධාන වශයෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ තේ අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම මාසය තුළ කුළුබඩු, රබර් සහ එළවළු අපනයන ආදායමේ පහළ යෑමක් සිදුවිය.

# කාර්මික අපනයන


## කාර්මික අපනයන ආදායම





## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය ජනවාරි





## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2024 වසරේ ජනවාරි මාසය තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය. තව ද, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායමෙහි කැපී පෙනෙන පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, ඛනිජතෙල් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායමෙහි ඉහළ යෑමක් පැවතුණි.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය -ජනවාරි





## ආනයන පරිමා හා මිල දර්ශකය - ජනවාරි





අන්තර් භාණ්ඩ ආනයන වියදමෙහි පහළ යෑමක් දක්නට ලැබුන ද, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ ජනවාරි මාසය තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 7.7කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 1.4කින් පහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
### ජනවාරි





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ආහාර සහ පාන වර්ග මෙන්ම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2024 වසරේ ජනවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. තෙල් සහ මේද වර්ග, එළවළු සහ ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගිය අතර, සීනි හා රසකැවිලි සහ පාන වර්ග ආනයන වියදම පහළ යෑමක් සිදු විය.

## අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය ජනවාරි**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





* 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාස වල දී බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන් ඉන්ධන, විශේෂයෙන්ම පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන පහළ යෑම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. තවද, දියමන්ති හා වටිනා ගල් වර්ග හා ලෝහ වර්ග සහ සකස් නොකළ දුම්කොළ ආනයනවල පහළ යෑම් වාර්තා විය. ඊට ප්‍රතිවිරුද්ධව, මෙම මාසය තුළ මූල ලෝහ, රසායනික නිෂ්පාදිත සහ තිරිඟු ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය ජනවාරි**




ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2024 වසරේ ජනවාරි මාසය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) | ජන. 2023 | ජන. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **2,568.0** | **2,566.5** | **-0.1** | **191.0** | **195.5** | **2.4** |
| එයින් | තේ | 1,258.8 | 1,309.9 | 4.1 | 99.6 | 102.2 | 2.6 |
| | පොල් | 400.3 | 336.8 | -15.9 | 22.0 | 24.8 | 13.0 |
| | කුළුබඩු | 368.7 | 392.9 | 6.5 | 34.1 | 27.9 | -18.2 |
| | මුහුදු ආහාර | 269.0 | 262.2 | -2.5 | 20.9 | 23.0 | 9.8 |
| **කාර්මික අපනයන** | | **10,465.3** | **9,277.7** | **-11.3** | **781.3** | **771.5** | **-1.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 5,952.0 | 4,878.9 | -18.0 | 424.4 | 381.2 | -10.2 |
| | රබර් නිෂ්පාදිත | 977.0 | 902.2 | -7.7 | 72.7 | 80.0 | 10.2 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 568.0 | 539.4 | -5.0 | 46.4 | 85.9 | 85.0 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 519.5 | 539.3 | 3.8 | 34.7 | 44.0 | 26.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 580.9 | 598.2 | 3.0 | 50.8 | 40.0 | -21.3 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 450.6 | 500.0 | 11.0 | 54.1 | 48.2 | -11.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 85.8 | 71.2 | -17.0 | 5.2 | 4.3 | -18.8 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **73.2** | **66.4** | **-9.2** | **5.9** | **3.8** | **-36.9** |
| **මුළු අපනයන** | | **13,106.4** | **11,910.7** | **-9.1** | **978.2** | **970.7** | **-0.8** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) | ජන. 2023 | ජන. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **2,813.0** | **3,043.9** | **8.2** | **218.5** | **281.3** | **28.8** |
| **ආහාර හා පාන වර්ග** | | 1,607.9 | 1,693.0 | 5.3 | 118.3 | 156.6 | 32.3 |
| එයින් | එළවළු (ආ) | 318.4 | 358.6 | 12.6 | 24.1 | 33.8 | 40.1 |
| | සහල් | 292.5 | 17.1 | -94.2 | 2.1 | 19.0 | 796.2 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 1,205.1 | 1,350.9 | 12.1 | 100.2 | 124.8 | 24.6 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 533.4 | 667.0 | 25.0 | 51.0 | 56.2 | 10.3 |
| **අන්තර් භාණ්ඩ** | | **12,438.8** | **11,006.6** | **-11.5** | **1,005.9** | **980.5** | **-2.5** |
| එයින් | ඉන්ධන | 4,896.8 | 4,702.6 | -4.0 | 516.5 | 417.5 | -19.2 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 3,065.2 | 2,371.2 | -22.6 | 217.5 | 224.5 | 3.2 |
| | පොහොර | 275.9 | 235.0 | -14.8 | 9.6 | 9.0 | -5.9 |
| | තිරිඟු හා ඉරිඟු | 303.1 | 338.2 | 11.6 | 5.6 | 16.4 | 194.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **3,039.2** | **2,760.6** | **-9.2** | **199.0** | **250.0** | **25.6** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 1,969.0 | 1,867.6 | -5.1 | 132.6 | 166.0 | 25.1 |
| **මුළු ආනයන** | | **18,291.0** | **16,811.1** | **-8.1** | **1,423.4** | **1,511.8** | **6.2** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) | ජන. 2023 | ජන. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -5,184.6 | -4,900.4 | | -445.2 | -541.1 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජන. -දෙසැ. 2022 | ජන. -දෙසැ. 2023 | වෙනස (%) | ජන. 2023 | ජන. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 152.0 | 138.1 | -9.1 | 136.1 | 135.1 | -0.8 |
| | පරිමා දර්ශකය | 163.0 | 166.1 | 1.9 | 192.1 | 200.5 | 4.4 |
| | මිල දර්ශකය | 93.3 | 83.2 | -10.8 | 70.9 | 67.4 | -4.9 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.4 | 125.4 | -8.1 | 127.4 | 135.3 | 6.2 |
| | පරිමා දර්ශකය | 126.0 | 129.8 | 3.0 | 157.4 | 169.5 | 7.7 |
| | මිල දර්ශකය | 108.3 | 96.6 | -10.8 | 80.9 | 79.8 | -1.4 |
| **වෙළඳ මිල අනුපාතය** | | 86.1 | 86.1 | -0.1 | 87.6 | 84.4 | -3.6 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද